www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# චීන රාජ්‍යයේ අස්ථාවරත්වය පෙන්නුම් කරන සින්ජියැන්හි නොසංසුන්තාව

## Xinjiang unrest reveals fragility of Chinese state

2009 ජුලි 13

1949 විප්ලවයේ 60 වන සංවත්සරය එලඹෙමින් තිබිය දී, ජුලි 5 දින සින්ජියැන්හි උයිගර් කම්කරුවන්ගේ හා සිසුන්ගේ විරෝධතා කෙරෙහි පලවූ චීන ආන්ඩුවේ කුරිරු මිලිටරි ප්‍රතිචාරය, බිලියන 1.3 ක ජනගහනයකින් ද ජනවර්ගයන් 56 ක් හා විවිධ භාෂා වලින් සැදුම්ලත් ඒකාබද්ධ චීනයේ මුලු පදනම ම ප්‍රශ්නයට බඳුන් කර තිබේ.

නිෂ්පාදන බලවේගයන්ගේ පොදු අයිතිය මත සියලු වාර්ගික පසුබිම් සහිත කම්කරුවන් හා ගොවීන් ඒකාබද්ධ කරන පදනමක, සමාජවාදයේ හා සමානාත්මතාවයේ දේශයක් ගොඩනැගීම පිලිබඳ චීන විප්ලවයේ පොරොන්දු බෙහෝ කලකට පෙර සිට ම අතුරුදහන් වී ගොසින් ය.

පසුගිය සතියේ උරුම්කි ප්‍රදේශයේ ජීවිත සිය ගනනක් බිලිගත් මිලිටරි-පොලිස් හා වාර්ගික ප්‍රචන්ඩත්වය, සමාජ ධනයේ අසමානවූ බෙදීම මඟින් පන්තීන්, ජනවර්ගයන් හා චීනය පුරා භූ දේශපාලනික කලාප අතර නිර්මානය කර තිබෙන බියකරු බෙදීම් සලකුනු කරයි. ඒ අතර වාරයේ උරුම්කි හා අනෙකුත් සින්ජියැන් නගරවල යොදවා ඇති සන්නද්ධ හමුදාවන් යලි වතාවක් පෙන්නුම් කරනුයේ ධනේශ්වර සූරාකෑම ක්‍රියාවට නගා ඇති ආකාරයයි.

තුර්කි ජනාධිපති ටයිප් ඒඩොගන් හැරෙන්නට කිසිදු ලෝක නායකයෙක්, සින්ජියැන්හි සිදුකල මර්දනය පිලිබඳව චීන කොමියුනිස්ට් පක්ෂ (සීසීපී) නායකයන් ප්‍රසිද්ධියේ හෙලා දැක නොමැත. ස්වදේශික සර්ව-තුර්කි ජාතිකවාදයට ඇමතීමේ අවශ්‍යතාව මුල්කරගෙන ඔහු, එම සිද්ධිය තුර්කි බස කථාකරන උයිගර් වරුන් "සංහාරය කිරීමකට සමාන" යයි ප්‍රකාශ කලේය.

සැබවින්ම ලෝක අධිරාජ්‍යවාදී ආන්ඩු, කම්කරුවන් ලබන සාමාන්‍ය වැටුප පැයකට ඇමරිකානු ඩොලර් ශත 20 ක් පමනක් ද එක්සත් ජනපදයට පසුව ලෝකයේ දෙවන විශාලතම ප්‍රකෝටිපතියන් කන්ඩායමක් (2008 වසරේදී 101) සිටින රාජ්‍යයක් තුල, සමාජ කම්පනයන් හා වාර්ගික ගැටුම් නොවැලැක්විය හැකි බව හොඳින්ම වටහාගෙන සිටිති.

ජුලි 12 දින චීනයේ වාර්ගික ප්‍රශ්න පිලිබඳ විශාරදයෙකු වන ග්‍රූ ග්ලැඩ්නි වෝල් ස්ට්‍රීට් ජර්නල් පුවත් පතට මෙසේ පවසා තිබුනි. "අභ්‍යන්තර ආරවුල්, උද්ධමනය, අසමානවූ ආර්ථික වර්ධනය හෝ පරම්පරාව සඳහා සිදුවන අරගලයෙන් දුබල වී ඇති චීනය, සංස්කෘතික හා භාෂාමය රේඛා ඔස්සේ තවදුරටත් බෙදී යා හැකිය. චීනය මුහුනපා සිටින තර්ජන බොහෝ කොටම එල්ල වන්නේ, සිවිල් නොසංසුන්තාවන් ගෙන් හා සමහර විට ඊනියා හන් බහුතරය තුලින් එල්ල කෙරෙන අභ්‍යන්තර වාර්ගික කැලඹීම් වලිනි. විදේශයෙහි ඉපිද, අධ්‍යාපනය ලද, සුන් යත් සෙන් චීනයේ අවසාන රජ පෙලපත අවසන් කල විප්ලවයට නායකත්වය දුන් අතර ඔහු දකුනේ වැසියෙක්ය යන කාරනය ද අප සිහි තබාගත යුතුය. එම රජ පෙලපත බිඳ වැටුනු කල නිතරම පාහේ විදේශික බලවතුන්ගේ සහාය ලත් තරගකාරී යුද දෙටුවන් භූමිභාගයන් සඳහා එකිනෙකා සමඟ යුද වැදුනේය."

මෙම ගැටුම්වල මූලාශ්‍රය වූයේ, සුන් ගේ නායකත්වයෙන් යුත් චීන ධනේශ්වරය, තමන්ට ඉඩම් හිමි රදලයන් හා අධිරාජ්‍යවාදී බලවතුන් සමඟ පැවති බැඳීම් ද, පීඩිත ජනතාවන් පෙල ගැස්වීමට ඔවුන් තුල තිබූ බිය ද නිසා, එක්සත් ජාතික රාජ්‍යයක් නිර්මානය කිරීමට අසමත් වීමයි. එම කර්තව්‍යය 1917 රුසියානු විප්ලවයෙන් ආවේෂය ලත් චීනයේ යෞවන කම්කරු පන්තියට පැවරී තිබුනි. කෙසේ වුව ද සීසීපී ය, ධනේශ්වර ක්වෝමින්ටෑනයට (කේඑම්ටී) යටත්විය යුතුයයි බලකරනු ලැබූ මොස්කව් ස්ටැලින්වාදී නිලධරයේ අවස්ථාවාදී පිලිවෙත හේතුකොට ගෙන, 1927 චීන විප්ලවයෙහි ගෙල සිරකෙරුනු අතර සින්ජියැන් වැනි දුර බැහැර ප්‍රදේශ කේඑම්ටී තන්ත්‍රයේ පාලනයට නතුකර ගැනීම දුෂ්කරවූ තතු යටතේ තවත් 20 වසරකට එරට පැවතියේ කැබලි වී ගිය දේශයක් ලෙසය.

අද දිනයේ සින්ජියැන් හි පැනනැගී ඇති දේශපාලන අර්බුදය, 1949 දී පිහිටුවන ලද චීන රාජ්‍යයේ ඓතිහාසික පරිනාමයෙහි ප්‍රතිපලයකි. මාවෝවාදීන් විසින් සිදුකල විප්ලවය කොමියුනිස්ට්වාදී නොව සමාජවාදී ද නොවීය. 1949 වන විට ගොවි ජනතාව වෙනුවෙන් සීසීපී, නාගරික කම්කරු පන්තිය සමඟ බැඳීම් සිඳ දමා බොහෝ කලක් ගතවී තිබුනි. සීතල යුද්ධය හා පැරනි අධිරාජ්‍යයන් සියල්ල බිඳ වැටීම තුලින් නිර්මිත සුවිශේෂිතව වාසි දායක කොන්දේසි යටතේ මාවෝ විසින් චීනය ඒකාබද්ධ කිරීම සිදුවූයේ, කොමියුනිස්ට් පක්ෂය සමාජවාදය සඳහා සටනට බැසීමට ප්‍රථම ධනේශ්වර ජාතික ප්‍රජාතන්ත්‍රවාදී කර්තව්‍යයන් සාක්ෂාත් කල යුතුය යන ස්ටැලින්වාදී "අවධි දෙකේ" න්‍යායේ කොටසක් වශයෙනි. චීනයේ නාගරික මධ්‍යස්ථානවල කම්කරු පන්තිය මාවෝගේ ගොවි හමුදාව විසින් රුදුරු ලෙස මර්දනය කරන ලදී. 1930 ගනන් හා 40 ගනන් වල උයිගර් ජාතිකවාදීන් හා චීන යුද දෙටුවන් විසින් පාලනය කල සින්ජියැන්, මාවෝගේ තන්ත්‍රයට අනුබද්ධ කරගනු ලැබුවේ, නිතරම පාහේ ස්ටැලින් ප්‍රවේනිදාස ක්‍රමය පිලිබඳව අනුගමනය කල පිලිවෙත මත, එනම් පීඩිත ජනතාවගේ දැනුවත් ව්‍යාපාරයක සහභාගිත්වයෙන් තොරව හා ප්‍රජාතන්ත්‍රවාදී ආකාරයකට නොව, බලහත්කාරය හා දේශපාලන උපාමාරු යොදාගැනීමෙනි. ආගමික සීමා පැනවීම් හා ස්වදේශික සිරිත් විරිත් නොතකා හැරීමේ බීජිනයෙහි යකඩ හස්තයකින් යුත් වාර්ගික ප්‍රතිපත්තිය මුල්බැස ගත්තේ, බටහිර බලවතුන්ට පමනක් නොව සෝවියට් සමාජවාදී සමූහාන්ඩුවේ ස්ටැලින්වාදී තන්ත්‍රයට ද එරෙහිව, ජාතික රාජ්‍යයේ හා ජාතික කර්මාන්තයේ මාවෝගේ පැල පදියම්වීම තුලය. භූමියේ සිරකාරයෙක් වූ සින්ජියැන් පලාත චීනයේ පිලිකන්න බවට පත් විය. එය චීන න්‍යෂ්ටික අත්හදාබැලීමේ මධ්‍යස්ථානය ද න්‍යෂ්ටික අවි ගබඩාව ද බවට පත්විය.

1971 දී එක්සත් ජනපද ජනාධිපති නික්සන්ගේ චීන සංචාරයත් ඉන් පසුව අනුගමනය කල ප්‍රතිපත්තීනුත් සලකුනු කලේ මාවෝ එක්සත් ජනපද අධිරාජ්‍යවාදය වෙත නැඹුරු වීමයි. එය දැන් චීනය යලි වතාවක් කැබලි වී යාමේ තර්ජනය මතු කරන ප්‍රබල බලවේගයන් මුදාහැර තිබේ. 1980 ගනන්වල සෝවියට් ග්‍රහනයේ පැවති ඇෆ්ගනිස්ථානය තුල එක්සත් ජනපද ක්‍රියාන්විතයන් සඳහා චීනයේ සහයෝගය, විශේෂයෙන් ම මුජාහිඩීන් ගරිල්ලන් සම්බන්ධ, සින්ජියැන්හි ම ඉස්ලාම්වාදයට පදනමක් සම්පාදනය කලේය.

1990 ගනන්වල දී සෝවියට් සංගමය බිඳ වැටීම හා සෝවියට් මධ්‍යම ආසියානු සමූහාන්ඩු වෙන්වී යාම මගින්, එක්සත් ජනපදයට සින්ජියැන් ද ඇතුලත් කලාපය තුල විනිවිද යාමට අවස්ථාව සැලසීය. මෙම බලපෑමට හරස් කැපීමේ අරමුනින් බීජිනය, සිය පාලනය ස්ථාපිත කර ගැනීම සඳහා සින්ජියැන් තුලට හන් ජනවර්ගය විශාල වශයෙන් සංක්‍රමනය කරවීමට තීරනය කලේය.

මින් පසුව චීනයේ සමස්ත කලාපයන් ම විදේශ ප්‍රාග්ධනයේ කාවැදීම සඳහා විවෘත කරනු ලැබූ අතර එහි ප්‍රතිපලය වූයේ සමාජ හා ජාතික ආතතීන් තව තවත් ගැඹුරු වීමයි. වසර 2000 දී ප්‍රදේශයේ සුවිශාල ඛනිජ සම්පත් උපුටා ගැනීම සඳහා බීජින් තන්ත්‍රය විසින් ආරම්භ කරන ලද "බටහිරට යන්න" වැඩ පිලිවෙලින් පසුව උරුම්කි ප්‍රදේශයේ සාප්පු සංකීර්න, ව්‍යාපාරික මහල් ගොඩනැගිලි හා විදේශ බැංකු ඉදිවීමට පටන් ගත්තේය. සින්ජියැන් පලාත තුල චීනයේ තෙල් සංචිත වලින් තුනෙන් එකක් පමන වන තෙල් ටොන් බිලියන 30 ක් ද ගල් අඟුරු වලින් සියයට 40 ක් ද ඇති අතර කපු පුලුන් වැනි එහි වානිජ්‍ය භෝග සඳහා ද එම පලාත ප්‍රමුඛත්වයක් උසුලයි. තව ද රුසියාව සමඟ ඇති අර්ධ සන්ධානය යටතේ මධ්‍යම ආසියාවේ තෙල් හා ගෑස් සොයා ඇදෙන චීන ප්‍රාග්ධනයේ නව දේශ සීමාව වන්නේ ද සින්ජියැන් ය.

සීසීපී සමඟ සබඳතා ගොඩනගා ගත් උයිගර් ප්‍රභූ කොටස්, චීනයේ නව ධනේශ්වර පැලැන්තියේ කොටසක් බවට පත්ව ඇති අතර, අති මහත් බහුතර ජනතාව රැකියාවල දී භාෂාමය වෙනස්කම් කිරීමත්, අධ්‍යාපනයේ පහත් මට්ටමත්, සියල්ලටත් වඩා ඔවුන් චීනයේ දැවැන්ත දුගී ශ්‍රම හමුදාවේ කොටසක් වීම නිසාත් බොහෝ පිටුපසින් ඇදී යති. සමහර ගනන් බැලීම්වලට අනුව සින්ජියැන් චීනය තුල ආර්ථික වශයෙන් අතිශයින්ම අසමානවූ ප්‍රාන්තයන් ගෙන් එකක් බවට දැන් පත්ව තිබේ. එසේද වුවත් එය, ගිනිකොන දිග ප්‍රාන්ත අතරින් වඩාත්ම සංවර්ධිත පලාත වනවාට අමතරව රටේ ඉහලම ඒක ජනක ආදායමට ද හිමිකම් කියයි.

උයිගර් ප්‍රභූවේ සමහර කොටස් සින්ජියැන් සංවර්ධනයේ ලාභ වලින් වැඩි පංගුව ඉල්ලා සිටින අතර ප්‍රධාන බටහිර බලවතුන් සමඟ ස්වාධීන සම්බන්ධකම් ගොඩනගා ගැනීමේ අවශ්‍යතාවෙන් ද පෙලෙයි. පිටුවහලේ සිටින උයිගර් නායක රෙබියා කදීර් මෙම ප්‍රවනතාවේ ප්‍රධානත්වය උසුලයි. ඇය චීනයේ ධනවත්ම කාන්තාවක් වන අතර සින්ජියැන් වෙලඳ මන්ඩලයේ ජ්‍යෝෂ්ඨ සාමාජිකාවක් ද සීසීපී යට උපදෙස් දෙන දශ ලක්ෂපතියන්ගේ පර්ෂදය වන චීන මහජන දේශපාලන උපදේශක සභාවේ

සාමාජිකාවක් ද වෙයි. උයිගර් සාමාන්‍ය ජනතාවගේ දුක් ගැනවිලි ගසාකන අතර, ධනේශ්වරයේ මෙම ස්ථරය වැඩ කරන ජනතාව කෙරෙහි බීජිනයේ පොදු පන්ති සතුරුකම ද බෙදා හදා ගනියි.

ස්ටැලින්වාදී තන්ත්‍රයේ ධනේශ්වර ගැති පිලිවෙතට කම්කරු පන්තියෙන් පලවූ විරෝධය කුරිරු ලෙස තලා දැමූ 1989 ටියනාන්මෙන් චතුරස්‍රයේ ඝාතනයෙන් ඉක්බිත්තෙහි, හාන් ස්වෝත්තමවාදයේ නැඟීම, බෙදුම්වාදයේ ප්‍රතිවිරුද්ධ කැඩපත බවට පත්ව තිබේ. ගොවි ජනතාව අතර සීසීපීය ට පැවති සාම්ප්‍රධායික සහයෝගිතා පදනම බොඳවී යද්දී, මධ්‍යම පන්තිය අතර ජන පදනමක් ගොඩනගා ගැනීමේ අටියෙන් සීසීපී, ඉතා දැනුවත්ව ඇවිස්සූ චීන ජාතිකවාදය අවසානයේ දී ජාතික එකමුතුව පලුදු කිරීම වේගවත් කල ක්‍රියාවලියකට පමනක් මඟ පෑදී ය.

දැන් රට එකට තබාගැනීම සඳහා සීසීපී මිලිටරි-පොලිස් මර්දනයේ පිහිට පතන අතරවාරයේ එයට බලගතු සමාජ, වාර්ගික හා භූගෝලීය කේන්ද්‍රාපසාරී ප්‍රවනතා යටපත් කල නොහැකි වී තිබේ. සියලු වර්ගයේ ජාතිකවාදයන්ට හා ස්වෝත්තමවාදයන්ට එරෙහිව සියලු වාර්ගික හැඩතල සහිත වැඩ කරන ජනතාව එකසත් කරන, විප්ලවකාරී ජාත්‍යන්තරවාදී සමාජවාදයේ ක්‍රියාමාර්ගයක් සහිතව චීන කම්කරු පන්තිය මැදිහත් වන තෙක්, උත්සන්න වන වාර්ගික ප්‍රචන්ඩත්වය සමඟ තවදුරටත් ගැඹුරු වෙමින් ඇති සිවිල් යුද්ධයේ තර්ජනය, නොවැලැක්විය හැකිය.

ජොන් චාන් විසිනි

□ □□□.□□□□.□□□